# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,937 - 2015 ඔක්තෝබර් මස 16 වැනි සිකුරාදා - 2015.10.16**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස : (IIඅ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු - ඇබෑර්තු ... ... ... ... | 1744 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 1749 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2015 නොවැම්බර් මස 06 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2015 ඔක්තෝබර් මස 23 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**ඩබ්ලිව්. ඒ. ඒ. ජී. ෆොන්සේකා,**
රජයේ මුද්‍රණාලයාධිපති. (*වැ. බ.*).

2015 ජනවාරි මස 22 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents. gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

**අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :**

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

**2. සේවා කොන්දේසි - සාමාන්‍ය :**

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකි ය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

**3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි**

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරිහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අනිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමගම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

**4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි**

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

**5. යුද්ධ සේවා අනුග්‍රහය**

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත භටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

**6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු**

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම**

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

**8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය**

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

# විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකිය :-

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම,

(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම,

(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,

(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,

(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම,

(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාගශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. :—

(i) විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii) යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාගශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක චක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කූඩු, මකන, රෙදි කෑලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii) යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

**විභාග කොමසාරිස් ජනරාල්.**

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

# තනතුරු — ඇබෑර්තු

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු — කොළඹ දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

01. ඉල්ලුම්කරුවන් අදාළ උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැළකිල්ල ලබන අය ද විය යුතු ය.

02. මෙම තනතුර සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයටම ඉල්ලුම් කළ හැකි ය.

03. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 30ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 60ට නොවැඩි විය යුතු ය.

04. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතු ය.

05. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරී කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකි ය.

06. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් රෙජිස්ට්‍රාර් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැකි ය.

07. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2015 නොවැම්බර් මස 16 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2015 සැප්තැම්බර් මස 23 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/A3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

### උපලේඛනය

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| කොළඹ | කොළඹ | කොම්පඤ්ඤවීදිය කොට්ඨාසයේ විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, කොළඹ 05. |

10-716

---

## රාජ්‍ය සේවා කොමිෂන් සභාව

රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ පරිවර්තන අධිකාරී (සිංහල/ඉංග්‍රීසි), (දෙමළ/ඉංග්‍රීසි), (සිංහල/දෙමළ) තනතුරු සඳහා සීමිත බඳවා ගැනීම - 2015

රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව විසින් මෙහි පහත සඳහන් තනතුරු සඳහා බඳවා ගැනීමට සුදුසුකම්ලත් ශ්‍රී ලාංකේය පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

1. පරිවර්තන අධිකාරී (සිංහල/ඉංග්‍රීසි) - තනතුරු සංඛ්‍යාව 1
2. පරිවර්තන අධිකාරී (දෙමළ/ඉංග්‍රීසි) - තනතුරු සංඛ්‍යාව 1
3. පරිවර්තන අධිකාරී (සිංහල/දෙමළ) - තනතුරු සංඛ්‍යාව 1

02. රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත තෝරා ගනු ඇත.

03. මාසික වැටුප් පරිමාණය රු. 20,030 - 365 x 11 - 500 x 18 -රු. 33,045 කි.

04. මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරකි.

05. සුදුසුකම් : පරිවර්තන අධිකාරී (සිංහල/ඉංග්‍රීසි) (දෙමළ/ඉංග්‍රීසි) හා (සිංහල/දෙමළ) තනතුරුවලට බඳවා ගැනීම සඳහා පහත සඳහන් සුදුසුකම් අදාළ වේ.

5.1 අධ්‍යාපන සුදුසුකම් :

**පරිවර්තන අධිකාරී (සිංහල/ඉංග්‍රීසි)**

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් සිංහල භාෂාව විෂයයක් සහිතව ලබාගත් උපාධියක් තිබීම; හෝ

විශ්ව විද්‍යාල, ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් භාෂා පරිවර්තනය පිළිබඳ ලබාගත් උපාධියක් තිබීම;

*හෝ*

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් භාෂා පරිවර්තනය පිළිබඳ ලබාගත් උපාධියක් තිබීම.

සහ

ඉංග්‍රීසි භාෂාව සඳහා අ. පො. ස. (සා. පෙළ) විභාගයේ විශිෂ්ට සාමාර්ථ්‍යයක් ලබා තිබීම හෝ අ. පො. ස. (උ. පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි භාෂාව සඳහා සාමාන්‍ය සාමාර්ථ්‍යයක් ලබා තිබීම.

**පරිවර්තන අධිකාරි (දෙමළ/ඉංග්‍රීසි)**
විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් දෙමළ භාෂාව විෂයක් සහිතව ලබාගත් උපාධියක් තිබීම;

හෝ

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් භාෂා පරිවර්තනය පිළිබඳ ලබාගත් උපාධියක් තිබීම;

සහ

ඉංග්‍රීසි භාෂාව සඳහා අ. පො. ස. (සා. පෙළ) විභාගයේ දී විශිෂ්ට සාමාර්ථ්‍යයක් ලබා තිබීම හෝ අ. පො. ස. (උ. පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි භාෂාව සඳහා සාමාන්‍ය සාමාර්ථයක් ලබා තිබීම.

**පරිවර්තන අධිකාරි (සිංහල/දෙමළ)**
විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් දෙමළ භාෂාව විෂයක් සහිතව ලබාගත් උපාධියක් තිබීම;

හෝ

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් භාෂා පරිවර්තනය පිළිබඳ ලබාගත් උපාධියක් තිබීම;

*දෙමළ මාධ්‍ය අයදුම්කරුවන් සඳහා :*

සිංහල භාෂාව සඳහා අ. පො. ස. (සා. පෙළ) විභාගයේ දී විශිෂ්ට සාමාර්ථ්‍යයක් ලබා තිබීම හෝ අ. පො. ස. (උ.පෙළ.) විභාගයේ දී සිංහල භාෂාව සඳහා සාමාන්‍ය සාමාර්ථ්‍යයක් ලබා තිබීම.

*සිංහල මාධ්‍ය අයදුම්කරුවන් සඳහා :*

දෙමළ භාෂාව සඳහා අ. පො. ස. (සා. පෙළ) විභාගයේ දී විශිෂ්ට සාමාර්ථ්‍යයක් ලබා තිබීම හෝ අ. පො. ස. (උ. පෙළ) විභාගයේ දී දෙමළ භාෂාව සඳහා සාමාන්‍ය සාමාර්ථ්‍යයක් ලබා තිබීම.

5.2 *පළපුරුද්ද :*

(i) ඒකාබද්ධ සේවයේ භාෂා පරිවර්තක I පන්තියේ හෝ විශේෂ පන්තියේ වසර හයක (6) සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කළ අයෙකු වීම;

*හෝ*

(ii) රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ භාෂා පරිවර්තකයකු ලෙස වසර පහක (5) සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කළ අයෙකු වීම.

(iii) රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ භාෂා පරිවර්තක සහකාර තනතුරේ වසර දහයක (10) සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කළ අයෙකු වීම.

5.3 *කායික සුදුසුකම් :*
සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතු ය.

5.4 *වෙනත් .*—තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ/ගැසට් පත්‍රයේ සඳහන් වන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

06. *බඳවා ගැනීමේ ක්‍රමය.*—ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ.

| | *ලකුණු ලබා දෙන ප්‍රධාන ක්ෂේත්‍ර* | *උපරිම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| 1. | අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 25 |
| 2. | තනතුරට අදාළව ලබා ඇති වෘත්තීය සුදුසුකම් | 35 |
| 3. | තනතුරට අදාළ ක්ෂේත්‍රය තුළ ලබා ඇති අතිරේක පළපුරුද්ද | 35 |
| 4. | සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන ලද කුසලතාව | 05 |
| | එකතුව | 100 |

6.1 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී පිළිබිඹු කරන කුසලතාව අනුව ඉහළම ලකුණු ලබා ගන්නා අයදුම්කරුවන් අතුරින් පවතින පුරප්පාඩු සංඛ්‍යාවට බඳවා ගනු ලැබේ.

| | |
|---|---|
| 1. අතිරේක අධ්‍යාපන සුදුසුකම් (උපරිම ලකුණු 25) | (i) අදල භාෂා දෙකම උපාධියේ විෂයයන් ලෙස හදරා තිබීම - ලකුණු 10<br>(ii) පශ්චාත් උපාධි සුදුසුකමක් ලබා තිබීම<br>(a) ඉල්ලුම් කරන භාෂාවන්ට අදලව පර්යේෂණ නිබන්ධනයක් සහිත අවම වශයෙන් ශාස්ත්‍රපති මට්ටමේ සුදුසුකමක් - ලකුණු 15<br>හෝ<br>(b) ඉල්ලුම් කරන භාෂාවන්ට අදලව පර්යේෂණ නිබන්ධයක් රහිත අවම වශයෙන් ශාස්ත්‍රපති මට්ටමේ සුදුසුකම් - ලකුණු 10<br>හෝ<br>(c) වෙනත් ඕනෑම පශ්චාත් උපාධි සුදුසුකම් - ලකුණු 05 |
| 2. තනතුරට අදලව ලබා ඇති වෘත්තීය සුදුසුකම් (උපරිම ලකුණු 35) | (i) භාෂා පරිවර්තනය පිළිබඳව, අවම වශයෙන්, එක් අවුරුද්දක කාලසීමාවකින් යුත් පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාවක් හදරා තිබීම, - ලකුණු 20<br>හෝ<br>භාෂා පරිවර්තනය පිළිබඳ අවම වශයෙන් අවුරුද්දක කාලසීමාවකින් යුත් ඩිප්ලෝමා පාඨමාලාවක් හදරා තිබීම - ලකුණු 10<br>හෝ<br>භාෂා පරිවර්තනය පිළිබඳ වෙනත් පාඨමාලාවක් හදරා තිබීම, ලකුණු 05<br>(ii) උපාධියේ විෂයයක් ලෙස හදරා නොමැතිව, ඉල්ලුම් කරන භාෂා යුගලයේ එක් භාෂාවට ඩිප්ලෝමා සුදුසුකමක් තිබීම - ලකුණු 05<br>(iii) ඉල්ලුම් කරන භාෂා යුගලයේ ප්‍රභව භාෂාවන්ගේ ප්‍රවීණතාව සනාථ කරන සුදුසුකම් - (භාෂාවකට 02 බැගින්), ලකුණු - උපරිමය 06<br>(iv) ඉල්ලුම් කළ භාෂා යුගලයට හෝ ඒවායේ ප්‍රභව භාෂාවන්ට අයත් නොවන භාෂා දැනුම - ලකුණු - උපරිමය 04 (භාෂාවකට 2 බැගින්) |
| 3. තනතුරට අදලව ලබා ඇති අතිරේක පළපුරුද්ද (උපරිම ලකුණු 35) | (i) තනතුරට අදලව ලබා තිබිය යුතු අනිවාර්ය පළපුරුද්දට අමතරව රජයේ සේවයේ භාෂා පරිවර්තන පළපුරුද්ද - අමතර වසරක් වෙනුවෙන් ලකුණු 01 බැගින්, උපරිම ලකුණු 10<br>(ii) පරිවර්තන අධීක්ෂකවරයෙකු ලෙස කටයුතු කර තිබීම - උපරිම ලකුණු 04<br>(iii) පරිවර්තන පුහුණුකරුවෙකු ලෙස කටයුතු කිරීම - උපරිම ලකුණු 03<br>(iv) සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට පිළිගත හැකි ප්‍රමිතියෙන් යුතු පරිවර්තන හෝ අනුවර්තන කෘතියකට එක් ලකුණ බැගින්, උපරිම ලකුණු 03<br>(v) පරිවර්තන අධිකාරිවරයෙකු ලෙස කටයුතු කිරීමට තමා සතු ශක්‍යතාවය තහවුරු කරන ඉදිරිපත් කිරීමක් - ලකුණු 15<br>(පරිවර්තන ගැටලු විසඳ ගන්නා ආකාරය, පරිවර්තන පිළිබඳ න්‍යායික දැනුම, පරිවර්තන ප්‍රවේශ සහ එළැඹුම්, භාෂණ පරිවර්තනය, පාරිභාෂික පද රැස් කිරීම සහ පදමාලා සම්පාදනය, විශාල පරිවර්තන ව්‍යාපෘතිවලට දයක වීම සහ සම්බන්ධීකරනය, පරිවර්තන ප්‍රභේද සහ ප්‍රවර්ග අනුකූලව පරිවර්තන මෙහෙයවීම සහ පරිවර්තකයින්ට උපදෙස් දීම, ආදිය ද පරිවර්තන කාර්යය සඳහා පරිගණක තාක්ෂණය භාවිතය හා සම්බන්ධ පෙළ සැකසුම් ඉහළ මට්ටමේ හැකියාව ( MS Word, Excel ආදි), සහ TRADOS, OMEGAT, WORDFAST වැනි පරිගණකාශ්‍රිත පරිවර්තන මෘදුකාංග පිළිබඳ දැනුම සහ පළපුරුද්ද සාකච්ඡාවට බඳුන් කෙරේ.) |
| 4. සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන ලද කුසලතාව | නායකත්ව පෞරුෂය, ඉදිරිපත් කිරීමේ විලාසය ආදී කරුණු ගැන අවධානය යොමු කෙරේ. ලකුණු 05 |

07. ඉල්ලුම් පත්‍රය පිරවීමේ දී ඉතා සැලකිලිමත්ව නිවැරදිව තොරතුරු සැපයිය යුතු ය. මෙම බඳවා ගැනීමේ පරීක්ෂණයේ නීති රීති අනුව යම් අපේක්ෂකයකු නුසුදුසු බව අනාවරණය වුවහොත් සම්මුඛ පරීක්ෂණයට පෙර හෝ පැවැත්වෙද්දී හෝ පසුව හෝ ඕනෑම අවස්ථාවක ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකිය. අයදුම්කරු විසින් ඉදිරිපත් කරන ලද තොරතුරු ඕනෑම අවස්ථාවක අසත්‍ය බව පෙනී ගියහොත් ඔහු/ඇය රජයේ සේවයෙන් පහ කිරීමට හැකිය.

08. අයදුම්පත්‍ර A4 (සෙ. මී. 24 x 29) ප්‍රමාණයේ කඩදාසි භාවිත කරමින්,

(අ) අංක 1 සිට 3.4 තෙක් ඡේදයන් පළමු පිටුවට ද,
(ආ) අංක 2 සිට ඉදිරියට වන ඡේදයන් අනෙක් පිටුවලට ද ඇතුළත් වන සේ අයදුම්පත්‍රය පිළියෙළ කර ගත යුතු ය.
(ඇ) අයදුම්පත්‍රය පිළියෙළ කර ගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් නම සිංහල භාෂාවෙන් යුතු අයදුම්පත්‍රවල සිංහල භාෂාවට අමතරව ඉංග්‍රීසි භාෂාවෙන් ද, දෙමළ භාෂාවෙන් යුතු අයදුම්පත්‍රවල දෙමළ භාෂාවට අමතරව ඉංග්‍රීසි භාෂාවෙන් ද සඳහන් කළ යුතු ය,

8.1 අයදුම්පත්‍රය බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ "පරිවර්තන අධිකාරි (සිංහල/ඉංග්‍රීසි), (දෙමළ/ඉංග්‍රීසි) (සිංහල/දෙමළ) තනතුරු සඳහා බඳවා ගැනීම - 2015" යන්න සඳහන් කරන්න.

8.2 සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය 2015.11.16 වැනි දිනට හෝ ඊට පෙර ලැබෙන සේ පහත දැක්වෙන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

රාජ්‍ය භාෂා කොමසාරිස්,
රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව,
අංක 341/7, භාෂා මන්දිරය,
කෝට්ටේ පාර,
රාජගිරිය.

09. මෙහි සඳහන් නොවන යම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ඇත. සියලුම අයදුම්කරුවන් මෙම ගැසට් පත්‍රයේ සඳහන් පොදු නීතිරීති අනුව කටයුතු කිරීමට බැඳී සිටිනු ඇත.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

වී. බී. පී. කේ. වීරසිංහ,
ලේකම්,
ජාතික සංවාද පිළිබඳ අමාත්‍යාංශය.

2015 ඔක්තෝබර් මස 02 වැනි දින,
ජාතික සංවාද පිළිබඳ අමාත්‍යාංශය,
40, බුත්ගමුව පාර,
රාජගිරිය.

***ආදර්ශ අයදුම්පත්‍රය***

***පරිවර්තන අධිකාරි (සිංහල/ඉංග්‍රීසි) (දෙමළ/ඉංග්‍රීසි) හා (සිංහල/දෙමළ) තනතුර සඳහා අයදුම්පත්‍රය***
Application for the Post of Superintendent of (Sinhala/English) (Tamil/English) and (Sinhala/Tamil) translations

කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා
[ ]

අයදුම්කරන තනතුර : [ ]
01. පරිවර්තන අධිකාරි (සිංහල/ඉංග්‍රීසි)
02. පරිවර්තන අධිකාරි (දෙමළ/ඉංග්‍රීසි)
03. පරිවර්තන අධිකාරි (සිංහල/දෙමළ)

(අදාළ අංකය සඳහන් කරන්න)

1. නම
   1.1 මුලකුරු සමඟ නම :- Mr./Mrs./Miss. :————.
   (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
   1.2 සම්පූර්ණ නම :————.
   (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
   1.3 සම්පූර්ණ නම :————.
   (සිංහලෙන්/දෙමළෙන්)
   1.4 ජාතික හැඳුනුම්පත් අංකය :- | | | | | | | | | | |

2. ලිපිනය :
   2.1 ස්ථිර ලිපිනය :————.
   (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

2.2 රාජකාරි ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

2.3 රාජකාරි ලිපිනය :————.
(සිංහලෙන්/දෙමළෙන්)

2.4 ප්‍රවේශපත් එවිය යුතු ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

2.5 දුරකථන අංකය :————.

2.6 අයදුම්කරු ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :————.

2.7 පදිංචිව සිටින කාල සීමාව :————.

2.8 ග්‍රාම නිලධාරි කොට්ඨාසය :————.

3. 3.1 ස්ත්‍රී පුරුෂ භාවය : ස්ත්‍රී -1 පුරුෂ - 0 ☐ (අදාළ අංකය ලියන්න)

3.2 විවාහක/අවිවාහක බව : විවාහක -1 අවිවාහක -2 ☐ (අදාළ අංකය ලියන්න)

3.3 උපන් දිනය : වර්ෂය ☐☐☐☐ මාසය ☐☐ දිනය ☐☐

3.4 2015.10.16 දිනට වයස : අවුරුදු ☐☐ මාස ☐☐ දින ☐☐

4. අධ්‍යාපන සුදුසුකම් :

4.1 (*a*) උපාධිය :————.
(*b*) උපාධිය ලබා ගත් වර්ෂය හා විශ්ව විද්‍යාලය :————.
(*c*) උපාධියට හැදෑරූ විෂයයන් :————.

4.2 අ. පො. ස. (උ. පෙළ) :

| *විෂයයන්* | *සාමාර්ථ්‍යය* |
|---|---|
| | |
| | |
| | |
| | |

4.3 අ. පො. ස. (සා. පෙළ)

| *විෂයයන්* | *සාමාර්ථ්‍යය* | *විෂයය* | *සාමාර්ථ්‍යය* |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

5. 5.1 සේවය/තනතුර :————.

5.2 පන්තිය :————.

5.3 2015.10.16 වැනි දිනට (නිවේදනය ගැසට් පත්‍රයේ පළ කරන දිනට) රජය යටතේ මුළු සේවා කාලය :-
අවුරුදු :————. මාස :————.

5.4 දැනට වාර්ෂික වැටුප : රු. :————.

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීම හා විශ්වාසය පරිදි සත්‍ය බවත්, මෙම බඳවා ගැනීමේ පරීක්ෂණයේ කොන්දේසි අනුව මා නුසුදුස්සකු බව පෙනී ගියහොත් පරීක්ෂණය පැවැත්වීමට පෙර හෝ එය පැවැත්වෙද්දී හෝ ඉන්පසු හෝ මාගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ගනු ලබන යම් තීරණයකට මා එකඟ වෙමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

*දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය*

මෙම අයදුම්පත්‍රය ඉදිරිපත් කරන ................................... මයා/මිය/මෙනවිය ............ දින සිට මෙම කාර්යාලයේ සේවය කරන බවත් ඔහුගේ/ඇයගේ වැඩ සහ හැසිරීම නිරන්තරයෙන්ම සතුටුදායක බවත් ඉහත සඳහන් තොරතුරු සියල්ලම මෙම කාර්යාලයේ ඇති වාර්තා ආශ්‍රයෙන් මම පෞද්ගලිකවම පරීක්ෂා කර බැලූ බවත් ඒවා නිවැරදි බවත් 2015 ............ මස ......... දින ඔහු/ඇය මා ඉදිරිපිට දී අත්සන් කළ බවත් මෙයින් සහතික කරමි. තෝරාගනු ලැබුවහොත් ඔහු/ඇය සේවයෙන් මුදාහැරිය හැකිය/නොහැකිය.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.

නම :————.
තනතුර :————.
නිල මුද්‍රාව :————.

දිනය :————.

10-715

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## රාජ්‍ය සේවා කොමිෂන් සභාව

### කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයේ සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ විධායක සේවා ගණයේ III ශ්‍රේණියේ සහකාර සමාගම් රෙජිස්ට්‍රාර් තනතුර සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2015

සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ විධායක සේවා ගණයේ III ශ්‍රේණියේ සහකාර සමාගම් රෙජිස්ට්‍රාර් තනතුරෙහි පවතින පුරප්පාඩු 02ක් පිරවීම සඳහා අංක 02හි සඳහන් සුදුසුකම්ලත් අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

1. බඳවා ගැනීමේ ක්‍රමය :

නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් ලිඛිත පරීක්ෂණයකට හා සම්මුඛ පරීක්ෂණයකට භාජනය කිරීමෙන් අනතුරුව, ලිඛිත විභාගයේ දී ලබාගත් ලකුණුවල කුසලතාව මත රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අයදුම්කරුවන් බඳවා ගනු ලැබේ.

2. අවශ්‍ය සුදුසුකම් :

2.1 අධ්‍යාපන සුදුසුකම්/වෘත්තීය සුදුසුකම්/පළපුරුද්ද-

(i) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් නීතිය පිළිබඳ උපාධියක් ලබා තිබීම;

හා

(ii) ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයෙකු වීම;

හා

(iii) දිවුරුම් දීමෙන් අනතුරුව නීතිඥයෙකු වශයෙන් අවුරුදු 03කට නොඅඩු සක්‍රීය පළපුරුද්දක් තිබීම.

2.2 කායික සුදුසුකම් :

සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සහ විදේශීය ඕනෑම රටක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි

ඉටුකිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

2.3 *වයස් සීමාව* :
අයදුම්කරුවන් අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 21ට නොඅඩු හා වයස අවුරුදු 35ට වැඩි නොවිය යුතුය. (ඒ අනුව වයස සම්බන්ධ සුදුසුකම සපුරාලනුයේ අයදුම්කරුගේ උපන්දිනය 1994.11.16 දින හෝ ඊට පෙර හා 1980.11.16 දින හෝ ඊට පසුව යෙදී ඇත්නම් පමණි.)

2.4 *වෙනත්* :
(i) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
(ii) අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතු ය.
(iii) අයදුම්පත් කැඳවනු ලබන අවසන් දිනට මෙම තනතුර සඳහා බඳවා ගැනීමට අවශ්‍ය සුදුසුකම් සෑම ආකාරයකින් සම්පූර්ණ කර තිබිය යුතුය.

3. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි හා සේවා කොන්දේසි* :

(i) මෙම තනතුර ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු හා අනත්දරු/වැන්දඹු පුරුෂ හා අනත්දරු, විශ්‍රාම වැටුප් ක්‍රමයට දයක මුදල් ගෙවිය යුතුය.

(ii) පත්වීම අවුරුදු 03ක පරිවාස කාලයකට යටත්ය. විධායක සේවා ගණයේ III ශ්‍රේණියේ සහකාර සමාගම් රෙජිස්ට්‍රාර් තනතුර සඳහා බඳවා ගෙන වසර 03ක් ඇතුළත බඳවා ගැනීමේ පටිපාටියේ සඳහන් පරිදි පළමුවැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත්විය යුතුය.

(iii) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 01/2014ට අනුව හා ඊට අනුශාංගික චක්‍රලේඛ අනුව තනතුරට බැඳී වසර 05ක් ඇතුළත සේවාවට බැඳුණු භාෂාවට අතිරේකව අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳ අදළ ප්‍රවීණතාවය ලබාගත යුතු අතර, රාජ්‍ය භාෂාවක් නොවන මාධ්‍යකින් සේවයට බැඳුණු නිලධාරීන් විසින් පරිවාස කාලය තුළ නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබා ගත යුතුය.

(iv) රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවලට ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට ද, රජයේ මුදල් රෙගුලාසිවලට ද, දෙපාර්ත-මේන්තුගත අනෙකුත් නියෝගවලට ද මෙම පත්වීම යටත් වේ.

4. වැටුප් පරිමාණය :

මෙම තනතුරට හිමි මාසික වැටුප් පරිමාණය, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06/2006 හි එස්. එල්.-1-2006 අනුව —
රු. 22,935/-10x645-8x790-17x1,050-රු. 53,555 වේ.

5. *ලිඛිත පරීක්ෂණය* :

(i) රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙනුවෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් 2016 පෙබරවාරි මස කොළඹ දී පවත්වනු ලැබේ.

(ii) විභාගය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන මාධ්‍යයන්ගෙන් පැවැත්වේ.

(iii) අයදුම්කරුට ඉහත දක්වා ඇති භාෂා මාධ්‍ය එකකින් විභාගයට පෙනී සිටිය හැක.
එසේ වුව ද ඔහු/ඇය තමන් තෝරා ගත් එක් භාෂා මාධ්‍යයකින් පමණක් සියලුම විෂයයන්ට පෙනී සිටිය යුතුය. ඉල්ලුම් කරන මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

(iv) ලිඛිත විභාගය පහත සඳහන් විෂයයන් පිළිබඳ ප්‍රශ්න පත්‍රවලින් සමන්විත වේ.

| *විෂය අංකය* | *විෂයය* | *නියමිත කාලය* | *ලකුණු* | *සමත් ලකුණු ප්‍රමාණය (අවම)* |
|---|---|---|---|---|
| (1) | ඉංග්‍රීසි භාෂාව | පැය 02 | 100 | 40% |
| (2) | සාමාන්‍ය බුද්ධිය | පැය 01 | 100 | 40% |

ලිඛිත පරීක්ෂණයේ විෂය නිර්දේශය :

(01) ඉංග්‍රීසි භාෂාව :

(i) *අවබෝධය.*—වචන 200ට නොවැඩි තෝරාගත් ලිඛිත ඛණ්ඩයක් කියවා අවබෝධ කර පිළිතුරු සැපයීමේ හැකියාව පරීක්ෂා කෙරේ.

(ii) *ව්‍යාකරණ.*—කාල, නාම, ක්‍රියා, ඍජු සහ වක්‍ර කථනය කර්මකාරක හා කතෘකාරක වාක්‍ය, ලිංග භේදය, නිපාත ආදී ක්ෂේත්‍රයන්හි සරල අවබෝධය පරීක්ෂා කෙරේ.

ව්‍යාකරණ, වාග් මාලාව සහ අවබෝධය පිළිබඳව අපේක්ෂකයා සතු දැනුම පිරික්සීම සඳහාය. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය.

(02) *සාමාන්‍ය බුද්ධිය.*—පදගත, සංඛ්‍යාත්මක සහ රූපාකාර සංදර්භයන් තුළ ඉදිරිපත් කෙරෙන ගැටලු සම්බන්ධයෙන් අයදුම්කරුගේ නිගමන සහ ප්‍රතිචාර පරීක්ෂා කිරීම තුළින් අයදුම්කරුගේ අවබෝධ කර ගැනීමේ ශක්තිය සහ බුද්ධිය මැනීම මෙයින් අපේක්ෂා කෙරේ. මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න 50කින් යුක්ත වන අතර එම ප්‍රශ්න බහුවරණ හා කෙටි පිළිතුරු සැපයීමේ මාදිලියේ ප්‍රශ්න වේ. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය.

6. *සම්මුඛ පරීක්ෂණය* :

(i) ලිඛිත පරීක්ෂණයේ සියලුම ප්‍රශ්න පත්‍රවලට පෙනී සිට, සෑම ප්‍රශ්න පත්‍රයක් සඳහාම ලකුණු 40% නොඅඩුව ලබාගත් අයදුම්කරුවන් අතරින් ප්‍රමුඛතාවය අනුව ඉහළම ලකුණු ලබාගත්, පවතින පුරප්පාඩු සංඛ්‍යාවට සමාන අයදුම්කරුවන් පිරිසක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබයි.

(ii) රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් අපේක්ෂක අපේක්ෂිකාවන්ගේ මුලික සුදුසුකම් හා සහතිකපත්‍ර පරීක්ෂා කරනු ලබයි. සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ලබා නොදෙන අතර ලිඛිත විභාගයේ ප්‍රතිඵල අයදුම්කරුවන් වෙත දන්වා යැවීම විභාග කොමසාරිස් ජනරාල් මඟින් සිදු කෙරෙනු ඇත.

7. *අයදුම්කරන ආකාරය* :

(i) අයදුම්පත්‍ර, ආදර්ශ ආකෘතියට අනුව A4 පත්‍රයක සකස් කොට ඉදිරිපත් කළ යුතුය. A4 පත්‍රයේ දෙපසම පාවිච්චි කළ යුතු අතර, අයදුම්පත්‍රයේ ශීර්ෂ අංක 1 සිට 5 දක්වා පළමු පිටුවට ද, ඉතිරිය දෙවන හා තෙවන පිටුවට ද ඇතුලත් වන සේ අයදුම්පත සකස් කළ යුතුය. අයදුම්පත අපේක්ෂකයාගේ අත් අකුරින්ම පැහැදිලිව

පිරවිය යුතුය. අයදුම්පත්‍රය පිළියෙළ කර ගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම, සිංහල අයදුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන්ද, දෙමළ අයදුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන්ද යෙදිය යුතුය.

ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන අයදුම්පත්‍ර සහ අසම්පූර්ණ තොරතුරු සඳහන් කර ඇති අයදුම්පත්‍ර දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඔබ විසින් ඉදිරිපත් කරන අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

(ii) අපේක්ෂකයා/අපේක්ෂිකාව විභාගයට පෙනී සිටීමට අදහස් කරන භාෂා මාධ්‍යයෙන් අයදුම්පත පිළියෙළ විය යුතුය.

(iii) සම්පූර්ණ කරන ලද අයදුම්පත ''විභාග කොමසාරිස් ජනරාල්, සංවිධාන හා විදේශ විභාග ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ. පෙ. 1503, කොළඹ'' යන ලිපිනය වෙත 2015.11.16 වන ද හෝ ඊට ප්‍රථම ලැබෙන පරිදි ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතුය. එදිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් බහා එවන කවරයේ වමත්පස ඉහළ කෙලවරේ ''සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ විධායක සේවා ගණයේ III ශ්‍රේණියේ සහකාර සමාගම් රෙජිස්ට්‍රාර් තනතුර සඳහා බඳවා ගැනීම (විවෘත)'', යනුවෙන් පැහැදිලිව සලකුණු කර තිබිය යුතුය.

(iv) අයදුම්පත්‍රයේ ද විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රයේ ද අයදුම්කරුගේ අත්සන සහතික කර තිබිය යුතුය. කිසියම් ආයතනයකින් විභාගයට ඉල්ලුම්කරන අයදුම්කරුවෙකු තම අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු ලවාද, එසේ නොවන අයදුම්කරුවෙකු තම අත්සන රජයේ පාසලක ප්‍රධානියකු, කොට්ඨාසයේ ග්‍රාම නිලධාරිවරයෙකු, සමාදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතිඥවරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරිලත් නිලධාරියකු, රු. 275,220 ක් හෝ ඊට වැඩි හෝ වාර්ෂික ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ හෝ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියකු හෝ ලවා සහතික කරවා ගත යුතුය.

(v) සෑම අතින්ම සම්පූර්ණ නොවූ අයදුම්පත් ප්‍රතික්ෂේප වනු ඇත. තැපෑලේ දී යම් අයදුම්පතක් නැති වූ බවට හෝ ප්‍රමාද වූ බවට හෝ ඉදිරිපත් කෙරෙන පැමිණිලි සළකා බලනු නොලැබේ.

(vi) *ගැසට් නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම්කර ඇතැයි යන පූර්ව නිගමන මත නිවේදනයේ සඳහන් වයස් සීමාව තුළවන, අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා ඊට අදළ ලදුපත සමඟ විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍ය, අයදුම්කරුගේ අත්සන හා අත්සන සහතික කිරීමද, අදළ නම් පමණක් දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය ද සහිතව නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමු කොට ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත.*

(vii) විභාග ප්‍රවේශපත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පළ කරනු ඇත. නිවේදනයේ සඳහන්, විභාගය පැවැත්වෙන දිනයට අවම වශයෙන් දින පහකටවත් පෙර තම ප්‍රවේශ පත්‍රය නොලද අපේක්ෂකයෙක් වේ නම් දන්වීමේ සඳහන් පරිදි ඒ පිළිබඳව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ සංවිධාන හා විදේශ විභාග ශාඛාවෙන් විමසිය යුතුය. එසේ විමසීමේ දී අයදුම්කරු, තමා ඉල්ලුම්කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ යුතුය. අයදුම්කරු කොළඹින් බැහැර පදිංචිකරුවකු නම්, එම විස්තර සමඟ, ෆැක්ස් මගින් විභාග ප්‍රවේශ පත්‍රයේ පිටපතක් කඩිනමින් ලබා ගැනීමට හැකි අයදුම්කරුගේ ෆැක්ස් අංකයක්ද සඳහන් කරමින් ඉල්ලීම් ලිපියක් දන්වීමේ සඳහන් ෆැක්ස් අංකය වෙත යොමු කරමින්ම විමසා සිටීම වඩාත් ඵලදයී වනු ඇත. එසේ විමසීමේ දී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා තමා ළඟ තබාගත් අයදුම්පත්‍රයේ පිටපත, විභාග ගාස්තු ගෙවීමෙන් ලද ලදුපතෙහි පිටපත හා අයදුම්පත්‍රය තැපැල් කිරීමේ දී ලියාපදිංචි කළ කුවිතාන්සිය සුදනමින් තබා ගැනීම ද ප්‍රයෝජනවත් වනු ඇත.

8. *විභාගයට ප්‍රවේශය :*

(i) සම්පූර්ණ අයදුම්පත් එවූ සුදුසුකම් සපුරා ඇති සියලු දෙනාටම විභාග කොමසාරිස් ජනරාල් විසින් ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. විභාගයට පෙනී සිටින අයදුම්කරුවකු අත්සන සහතික කරවාගත් තම ප්‍රවේශ පත්‍රය විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. ප්‍රවේශ පත්‍රය ඉදිරිපත්කිරීමට අපොහොසත් වන අපේක්ෂකයෙකුට/ අපේක්ෂිකාවකට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයන් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත්වීමට ඔහුට/ඇයට සිදුවනු ඇත.

(ii) අයදුම්කරුවෙකු විභාගයට පෙනී සිටිය යුත්තේ ඔහුට/ඇයට නියම කරන ලද විභාග ශාලාවේ දීය. සෑම අපේක්ෂකයෙකු/ අපේක්ෂිකාවකම විභාගයට පෙනී සිටින පළමු වන දිනයේ දී ම විභාගයට පෙනී සිටීමට පෙර, තම ප්‍රවේශ පත්‍රය, විභාග ශාලාධිපතිට භාරදිය යුතුය. සියලුම අයදුම්කරුවන් විසින් පිළිපැදිය යුතු නීති මාලාවක් මේ ගැසට් පත්‍රයේ පළ වේ.

*සටහන.—*

අපේක්ෂකයෙකුට ප්‍රවේශ පත්‍රයක් නිකුත් කළ පමණින් ඔහු/ඇය ගැසට් නිවේදනයෙන් අපේක්ෂිත සුදුසුකම් සපුරා ඇති බවක් නොහැඟේ.

9. *විභාග ගාස්තු :*

විභාග ගාස්තුව රු. 1,000 ක් වන අතර අයදුම්පත් භාර ගැනීම අවසන් කරන දිනයට පෙර මෙම ගාස්තුව විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදයම් ශීර්ෂ 2003-02-13 යටතේ රජයේ ආදායමට බැරවන පරිදි දිවයිනේ පිහිටි ඕනෑම තැපැල්/උපතැපැල් කාර්යාලයකට මුදලින් ගෙවා අයදුම්කරුගේ නමින් ලබාගන්නා ලදුපත එහි එක් දාරයක් මගින් අයදුම්පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවෙන ලෙස ඇලවිය යුතුය. විභාග ගාස්තුව සඳහා මුදල් ඇණවුම් හෝ මුද්දර භාර ගනු නොලැබේ. අදළ කුවිතාන්සියේ ඡායාපිටපතක් අයදුම්කරු විසින් තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැකිය.

*සටහන.—*

කවර හේතුවක් නිසා වුව ද විභාගයෙන් ඉවත් වන හෝ, නොපැමිණ සිටින හෝ, විභාගයට පෙනී සිටීමෙන් පසු සුදුසුකම් නැත්තෙකු බවට දක්නට ලැබෙන හෝ යම් අපේක්ෂකයෙකුට විභාග ගාස්තුව මුළුමනින්ම හෝ ඉන් කොටසක් හෝ ආපසු ලබා ගැනීමට හිමිකමක් නැත.

10. *අයදුම්කරුගේ අනන්‍යතාවය :*

අයදුම්කරු තමන් පෙනී සිටින එක් එක් විෂයයක් පාසා විභාග ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ඔහුගේ/ඇයගේ අනන්‍යතාව ඔප්පු

කළ යුතු වේ. මේ සඳහා මතු සඳහන් ලියවිලිවලින් කවරක් හෝ පිළිගනු ලැබේ.

(i) පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත;

(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය.

11. සාවද්‍ය තොරතුරු සැපයීම :

ඔබ විසින් එවන ලද අයදුම්පත්‍රයේ සඳහන් කර ඇත්තාවූ යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බව බඳවා ගැනීමට පෙර අනාවරණය වුවහොත් අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. එබඳු අසත්‍ය හෝ වැරදි තොරතුරක් බඳවා ගැනීමෙන් පසුව අනාවරණය වුවහොත් ඊට අදළ ක්‍රියා මාර්ගයන්ට යටත් ව සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

12. මෙම නිවේදනයේ සඳහන් නොවන යම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධයෙන් අවසාන තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි වන්නේ ය. එමෙන්ම පුරප්පාඩු පිරවීම හෝ නොපිරවීම හෝ පුරප්පාඩු වලින් කොටසක් පිරවීම පිළිබඳ අවසාන තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුවේ.

13. මෙම ගැසට් නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත් සිංහල භාෂා පාඨය බල පැවැත්වේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

ලේකම්,
කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය.

2015 ඔක්තෝබර් මස 16 වැනි දින.
ගාලු පාර,
කොළඹ 03.

**ආදර්ශ අයදුම්පත්‍රය**

***කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයේ සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ විධායක සේවා ගණයේ III ශ්‍රේණියේ සහකාර සමාගම් රෙජිස්ට්‍රාර් තනතුර සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය (2015)***

*Recruitment to the Executive Category of Grade III (open) Post of Assistant Registrar of Companies in the Department of Registrar of Companies under the Ministry of Industry and Commerce (2015)*

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍ය :- ☐
සිංහල - 2
දෙමළ - 3
ඉංග්‍රීසි - 4
අදල අංකය කොටුව තුළ ලියන්න.

01. 1.1 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :————.
(උදා :- HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA) :————.
1.2 අගට යෙදෙන නම මුලින්ද අනෙකුත් නම්වල මුලකුරු පසුවද යොද නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :————.
(උදා :-GUNAWARDHANA, H. M. S. K.)
1.3 සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :————.
1.4 ජාතික හැඳුනුම්පත් අංකය : ☐☐☐☐☐☐☐☐☐☐

02. 2.1 ස්ත්‍රී/පුරුෂ භාවය (අදළ අංකය කොටුව තුළ ලියන්න.) :
පුරුෂ - 0
ස්ත්‍රී - 1 ☐

2.2 විවාහක/අවිවාහක බව :————.

03. 3.1 ස්ථිර ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරින්)
3.2 ස්ථිර ලිපිනය :————.
(සිංහලෙන්/දෙමළෙන්)
3.3 දුරකථන අංකය :————.

04. 4.1 උපන් දිනය :

වර්ෂය :————, මාසය :————, දිනය :————.

4.2 2015.11.16 දිනට වයස :

අවු. :————, මාස :————, දින :————.

05. 5.1 ශ්‍රී ලංකා පුරවැසියෙක් ද යන වග :————.
(පරම්පරාවෙන් ද ලියාපදිංචි වීමෙන් ද යන වග සඳහන් කරන්න.)

5.2 ජාතිය :————.

06. 6.1 අධ්‍යාපන සුදුසුකම්

| උපාධියේ නම හා වර්ෂය | විශ්ව විද්‍යාලය/ ආයතනය | ලියාපදිංචි අංකය | බාහිර/ අභ්‍යන්තර | විෂයයන් | සමත්වූ පන්තිය | උපාධිය වලංගු වන දිනය |
|---|---|---|---|---|---|---|
| | | | | | | |

6.2 වෘත්තීය සුදුසුකම් :————.

6.3 2015.11.16 දිනට වෘත්තීය පළපුරුද්ද ඃ

අවු. :————, මාස :————, දින :————.

07. රාජ්‍ය සේවයෙන් පහකරනු ලැබූ හෝ ධූරය හැර ගිය අයෙකු ලෙස සලකනු ලැබූ කෙනෙක් ද යන වග :————.

08. 8.1 කිසියම් වරදකට උසාවියෙන් දඬුවම් ලබා තිබේ ද ? :————.

8.2 පිළිතුර ''ඔව්'' නම් ඒ පිළිබඳ විස්තර :————.

09. විභාග ගාස්තු ගෙවූ ලදුපත පිළිබඳ විස්තරය :————.

9.1 විභාග ගාස්තු ගෙවූ තැපැල් කාර්යාලය :————.
9.2 ලදුපත් අංකය හා දිනය :————.
9.3 ගෙවූ මුදල :————.

| ලදුපත නොගැලවෙන සේ එහි එක් දරයකින් මෙහි අලවන්න. |
|---|

10. අයදුම්කරුගේ සහතිකය ඃ

මෙහි සඳහන් කරන ලද තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසය පරිදි සත්‍ය බවත්, විභාග ගාස්තු ගෙවන ලද අංක ......... හා ......... වැනි දින දරන මුදල් කුවිතාන්සිය මීට අලවා ඇති බවත් ප්‍රකාශ කරමි. තවද විභාග නීති රීතිවලට අනුව ක්‍රියා කිරීමටත්, මෙම විභාගය පිළිබඳ කොන්දේසි අනුව මා නුසුදුස්සකු බව පෙනී ගියහොත් සම්මුඛ පරීක්ෂණයට පෙර, එය පවත්වද්දී හෝ ඉන්පසුව හෝ මාගේ විභාග අපේක්ෂකත්වය අවලංගු කිරීමට ගනු ලබන යම් තීරණයකට මම එකඟ වෙමි. තවද විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත් වන බවද ප්‍රකාශ කරමි

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

11. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම (ගැසට් නිවේදනයේ (7) iv පරිදි විය යුතුය)

මෙම ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කරන .......................... (සම්පූර්ණ නම) යන අය මා පෞද්ගලිකව හඳුනන බවත්, නියමිත විභාග ගාස්තුව ගෙවා ඇති බවත්, එම ලදුපත අලවා ඇති බවත්, ................. වැනි දින ඔහුගේ/ඇයගේ අත්සන මා ඉදිරියේ දී තැබූ බවත් මම සහතික කරමි.

————,
අත්සන සහතික කරන නිලධාරියාගේ
අත්සන හා නිල මුද්‍රාව.

දිනය :————.

අත්සන සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම :————.
තනතුර :————.
ලිපිනය :————.

12. ආයතන ප්‍රධානියාගේ සහතිකය (රාජ්‍ය/පළාත් රාජ්‍ය/රාජ්‍ය සංස්ථා සේවයේ නියුතු අයදුම්කරුවන් පමණි)

මෙම අයදුම්පත්‍රය ඉදිරිපත් කරන …………………… මහතා/මහත්මිය/මෙනවිය මෙම අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/ආයතනයේ ……….. ලෙස සේවය කරන අතර, ඔහුගේ/ඇයගේ අයදුම්පත්‍රය නිර්දේශය කර ඉදිරිපත් කරමි. මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් මෙම ආයතනයේ සේවයෙන් නිදහස් කිරීමට අවශ්‍ය කටයුතු සිදුකළ හැකිය.

————,
ආයතන ප්‍රධානියාගේ අත්සන.

දිනය :————.
නම :————.
තනතුර :————.
ලිපිනය :————.
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න.)

10-494

---

## ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

### දහම් පාසල් අවසාන සහතික පත්‍ර විභාගය - 2015

#### ව්‍යවස්ථා සහ නිර්දේශ පත්‍රය

01. 2015 වසරට නියමිත දහම් පාසල් අවසාන සහතික පත්‍ර විභාගය, විභාග කොමසාරිස් ජනරාල් විසින් 2016 පෙබරවාරි මස අග සති අන්තයක දී දිවයින පුරා පිහිටුවනු ලබන විභාග මධ්‍යස්ථානවල දී පවත්වනු ලැබේ.

02. *විභාග මධ්‍යස්ථාන.*—උපලේඛනයේ දක්වා ඇති සෑම දිස්ත්‍රික්කයක් තුළම අයදුම්කරුවන්ගේ සංඛ්‍යාව අනුව විභාග මධ්‍යස්ථාන පිහිටුවනු ඇත.

එහෙත් යම් නගරයක් සඳහා ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් ඉදිරිපත් නොවන අවස්ථාවල දී එකී නගරයේ විභාග මධ්‍යස්ථානය අවලංගු කොට අදාළ අයදුම්කරුවන් ඊට ආසන්නව පිහිටි වෙනත් විභාග මධ්‍යස්ථානයක් වෙත යොමු කිරීමට සිදුවනු ඇත. විභාග මධ්‍යස්ථාන පිහිටුවන දිස්ත්‍රික්ක හා නගර දැක්වෙන ලැයිස්තුව I වැනි උපලේඛනයෙහි දක්වා ඇත.

03. *භාෂා මාධ්‍යය.*—මෙම විභාගය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂාත්‍රයෙන්ම පවත්වනු ලැබේ.

04. *සුදුසුකම්.*—මෙම විභාගය සඳහා ඉල්ලුම් කරන සෑම අයදුම්කරුවකු ම පහත දක්වා ඇති සුදුසුකම් අතුරෙන් යටත් පිරිසෙයින් කවර හෝ එක් සුදුසුකමක් සපුරා තිබිය යුතු ය.

4.1 දහම් පාසලක නව වැනි ශ්‍රේණිය සමත් වී දහම් පාසල් අවසාන සහතික පත්‍ර පන්තියේ යටත් පිරිසෙයින් වර්ෂයක් හෝ ඉගෙනුම් කටයුතුවල නිරත වීම;

*හෝ*

4.2 ජාතික පොදු අධ්‍යාපන සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් හෝ අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් බුද්ධ ධර්මය විෂයය ඇතුළුව විෂයයන් හයකින් සමත් වී සිටීම හෝ ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් බුද්ධ ධර්මය විෂයය සහිතව සමත් වී සිටීම;

*හෝ*

4.3 කොළඹ තරුණ බෞද්ධ සංගමය මගින් පවත්වන ලද බෞද්ධ ශික්ෂා විභාගයේ ජ්‍යෙෂ්ඨ විභාගයෙන් සමත් වී සිටීම.

*සටහන.*— (i) මෙම විභාගය සඳහා ඉදිරිපත් වන සෑම අයදුම්කරුවකුම ඉහත 4 වැනි ඡේදයේ දක්වා ඇති සුදුසුකම් සපුරා ඇති බවට දහම් පාසල් ප්‍රධානාචාර්යවරයකු, පරිවේණාධිපතිවරයකු හෝ විද්‍යාලයාධිපතිවරයකු හෝ විසින් සහතික කළ යුතු ය.

(ii) විභාගාපේක්ෂකයන්ට මෙම විභාගය සඳහා ඉදිරිපත් විය හැක්කේ දහම් පාසල් අයදුම්කරුවකු වශයෙන් පමණකි.

05. *අයැදුම් කිරීම :*

5.1 *දහම් පාසල් අයැදුම්කරුවෝ.*—පසුගිය වසරේ හෝ ඊට පෙර වසරවල සිසුන් ඉදිරිපත් කළ සියලු ම දහම් පාසල් වෙත ප්‍රමාණවත් ඉල්ලුම්පත්‍ර සහ උපදෙස් පත්‍රිකා තැපැල් මගින් එවීමට කටයුතු සලසා ඇත. අයදුම්පත් නොලැබුණු යම් දහම් පාසලක් වේ නම්, දහම් පාසලේ නම, ලිපිනය, ඉදිරිපත් කරන අයදුම්කරුවන් ගණන යන විස්තර සඳහන් කොට මෙහි 5. 6 වැනි ඡේදයේ සඳහන් ලිපිනයට 2015.10.31 වැනි දිනට පෙර දැන්විය යුතු ය.

5.2 *බාහිර අයදුම්කරුවෝ.*—1999 වසරේ සිට බාහිර අයදුම්කරුවන් ලෙස කිසිදු අපේක්ෂකයකුට මෙම විභාගයට පෙනී සිටීමට ඉඩ දෙනු නොලැබේ. එසේ වුවත්, ඉහත 4 වැනි ඡේදයේ සඳහන් සුදුසුකම් සපුරා ඇති යම් විභාග අපේක්ෂකයකු වේ නම්, තමන් පදිංචි ස්ථානයට ආසන්න දහම් පාසල මගින් රුපියල් 150 ක විභාග ගාස්තුවක් ගෙවා විභාගයට පෙනී සිටීමට ඉල්ලුම් කළ

හැකිය. මේ සඳහා අවශ්‍ය උපදෙස් සියලු ම දහම් පාසල් ප්‍රධානීන් වෙත ලබාදෙනු ඇත.

5.3 අදාළ දහම් පාසල් ප්‍රධානීන් විසින් ම ඉදිරිපත් කළ යුතු මෙම අයදුම්පත් පිටපත් දෙකකින් යුතුව සකස්කර මුල් පිටපත විභාග කොමසාරිස් ජනරාල් වෙත ඉදිරිපත් කළ යුතු අතර, අනෙක් පිටපත දහම් පාසල් ප්‍රධානියා වෙත තබා ගත යුතු ය. අයදුම්පත්‍ර දෙකෙහිම ප්‍රධානාචාර්යවරයා අත්සන් කර තිබිය යුතු ය.

5.4 අයදුම්පත්‍ර භාර ගැනීමේ අවසාන දිනය 2015.11.16 වැනි දින වේ.

5.5 අයදුම්පත්වල අපේක්ෂකයින්ගේ නම් ඇතුළත් කිරීමේ දී උප්පැන්න සහතිකයේ සඳහන් ආකාරයටම විය යුතු අතර, ප්‍රතිඵල ලබාදීමෙන් පසුව නාම සංශෝධන සඳහා කරන ඉල්ලීම්වලදී, මුද්‍රණ දෝෂ හැරුණු විට වෙනත් ඉල්ලීම් සම්බන්ධව සලකා බලනු නොලැබේ. අයදුම්පත් පැහැදිළිව ද, නිවැරදිව ද සම්පූර්ණ කළ යුතු ය. එසේ නොවන අයදුම්පත් සහ අයදුම්පත් භාරගන්නා අවසාන දිනයට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

5.6 දහම් පාසලේ පරිගණක අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ යුතු අතර, ලිපිනය වෙනස් වී නම් එය දැන්විය යුතු අතර, දහම් පාසල් ප්‍රධානාචාර්යවරයා සෘජුවම සම්බන්ධ කර ගත හැකි දුරකථන අංකය ද සඳහන් කරන්න. සම්පූර්ණ කරන ලද අයදුම්පත් ලියාපදිංචි තැපෑලෙන් පහත සඳහන් ලිපිනයට යොමු කළ යුතු ය. අයදුම්පත් ලැබුණ බව දන්වා එවනු නොලැබේ. :-

විභාග කොමසාරිස් ජනරාල්,
සංවිධාන හා විදේශ විභාග ශාඛාව,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
තැ. පෙ. 1503, කොළඹ.

5.7 අයදුම්පත් බහා එවන කවරයේ වමත් පස ඉහළ කෙළවරේ **"දහම් පාසල් අවසාන සහතික පත්‍ර විභාගය - 2015"** යනුවෙන් ද, **ඉල්ලුම් කරන නගරය** ද සඳහන් කළ යුතු ය.

5.8 කිසිදු සහතිකයක් අයදුම්පත් සමග අමුණා එවීම අවශ්‍ය නොවේ.

5.9 අයදුම්කරුවන්ගේ අදාළ සහතික පිළිබඳවත්, සුදුසුකම් ලබා තිබීම පිළිබඳවත්, අයදුම්පත් සහතික කරන පරිවේණාධිපතිවරයා, හෝ ප්‍රධානාචාර්යවරයා හෝ විද්‍යාලයාධිපතිවරයා හෝ වගකිව යුතු ය.

5.10 විභාගයට ඉල්ලුම් කරන ලද සෑම අයදුම්කරුවෙකුම, ඉල්ලුම් පත්‍රයේ සම්පූර්ණ කර ඇති තමාගේ සියලුම තොරතුරු නිවැරදි ද යන්න පෞද්ගලිකවම පරීක්ෂාකර බලා අත්සන් කළ යුතු ය.

5.11 අයදුම්කරුවන් අත්සන් කර නැති, මකන දියර භාවිතා කරන ලද හා වෙනත් අඩුපාඩුකම් සහිත ඉල්ලුම් පත්‍ර මෙන්ම ඉල්ලුම් පත්‍ර භාර ගන්නා අවසාන දිනට පසුව ලැබෙන අයදුම්පත් කිසිම දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

6. *විභාග ගාස්තු.*—මෙම විභාගය සඳහා නියමිත සම්පූර්ණ විභාග ගාස්තුව රුපියල් 150 කි. එහෙත් ප්‍රථම වතාවට ඉදිරිපත් වන දහම් පාසල් අයදුම්කරුවන් පමණක් මෙම විභාග ගාස්තුවෙන් නිදහස් කරනු ලැබේ. ඌන සාමාර්ථ්‍යය සම්පූර්ණ කිරීම සඳහා ඉල්ලුම් කරන විෂයයට විභාග ගාස්තුව රුපියල් 50 කි.

6.1 *විභාග ගාස්තු ගෙවීම.*—දහම් පාසල් ප්‍රධානාචාර්ය විසින් විභාග ගාස්තු ගෙවීමට නියමිත සියලු ම අයදුම්කරුවන්ගේ විභාග ගාස්තු එකතු කොට, දිවයිනේ ඕනෑම තැපැල් කාර්යාලයකට එම මුදල ගෙවා, එක් ලදුපතක් ලබාගෙන, එම ලදුපත අයදුම්පත්‍රයේ පසු පිටේ නොගැලවෙන සේ අලවා එවිය යුතු ය. ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබාගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. (මුද්දර හා මුදල් ඇණවුම් භාරගනු නොලැබේ.).

6.2 *විභාග ගාස්තු ආපසු ගෙවීම.*—කුමන කරුණක් නිසාවත් මෙම විභාගය සඳහා ගෙවන විභාග ගාස්තුව වෙනත් විභාගයකට මාරු කිරීමක් හෝ ආපසු ගෙවීමක් හෝ සිදු කරනු නොලැබේ.

7. *ප්‍රවේශ පත්‍ර.*—විභාගයට ඇතුළත් කරගන්නා සෑම අයදුම්කරුවකු වෙතම විභාග කොමසාරිස් ජනරාල් විසින් ප්‍රවේශ පත්‍රයක්, ඉල්ලුම්පත් ඉදිරිපත් කළ දහම් පාසල් ප්‍රධානාචාර්ය මගින් නිකුත් කරනු ඇත.

7.1 විභාගයට පෙනී සිටින සෑම අයදුම්කරුවකු විසින් ම ස්වකීය ප්‍රවේශ පත්‍රයේ තම අත්සන සහතික කරවාගෙන, විභාගයට පෙනී සිටින ප්‍රථම අවස්ථාවේ දී ම විභාග ශාලාධිපති වෙත එය ඉදිරිපත් කළ යුතු ය. යම් අයදුම්කරුවකු තම ප්‍රවේශ පත්‍රය භාර නොදී සිටී නම් හා විභාග කොමසාරිස් ජනරාල් විසින් තමාට නියම කරන විභාග මධ්‍යස්ථානය හැර වෙනත් විභාග මධ්‍යස්ථානයක දී විභාගයට පෙනී සිටී නම්, ඔහුගේ විභාග අපේක්ෂකත්වය අහෝසි වනු ඇත.

7.2 ප්‍රවේශ පත්‍රයේ අයදුම්කරුගේ අත්සන, දහම් පාසල් ප්‍රධානාචාර්යවරයකු හෝ පරිවේණාධිපතිවරයකු හෝ රජයේ විද්‍යාලයාධිපතිවරයකු හෝ වර්ෂයකට රුපියල් 2,40,360 කට වැඩි ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ ස්ථිර සේවයෙහි නියුතු නිලධාරියකු හෝ විසින් සහතික කළ යුතු ය.

7.3 විභාගය පැවැත්වීමට නියමිත දිනට සතියකටවත් පෙර ප්‍රවේශපත්‍රය, නොලැබුණහොත්, එකී දහම් පාසල් ප්‍රධානියා විසින් ඒ බව නොපමාව විභාග කොමසාරිස් ජනරාල් වෙත දැන්විය යුතු ය. එවැනි සෑම අවස්ථාවකදී ම පහත සඳහන් විස්තර සැපයිය යුතු ය :

1. විභාගයේ නම :————.
2. දහම් පාසලේ නම :————.
3. දහම් පාසලට ලබා දී ඇති පරිගණක අංකය :————.
4. අයදුම්කරුගේ සම්පූර්ණ නම හා ලිපිනය :————.
5. ඉල්ලුම් කළ විභාග මධ්‍යස්ථානය/නගරය :————.
6. ඉල්ලුම්පත්‍රය තැපැල් කළ තැපැල් කාර්යාලය :————.
7. ලියාපදිංචි කළ අංකය හා දිනය :————.
8. විභාග ගාස්තු ගෙවා ඇත්නම් එම ලදුපතේ අංකය, දිනය හා තැපැල් කාර්යාලය :————.

8. *අනන්‍යතාව.*—එක් එක් විෂයයට පෙනී සිටින සෑම අවස්ථාවකම විභාග ශාලාධිපතිට පිළිගත හැකිවන පරිදි අපේක්ෂකයන් විසින්

තමන්ගේ අනන්‍යතාව ඔප්පු කිරීම සඳහා සූදානම්ව පැමිණිය යුතු ය. මේ සඳහා පහත සඳහන් ලියවිලිවලින් එකක් පිළිගනු ලැබේ ;

8.1 පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් විසින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත,

8.2 වලංගු විදෙස් ගමන් බලපත්‍රය,

8.3 බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද භික්ෂු හැඳුනුම්පත.

8.4 තැපැල් හැඳුනුම්පත

9. *සමත් බව තීරණය කිරීම හා ප්‍රතිඵල නිකුත් කිරීම.*—මෙම විභාගය සඳහා නියමිත විෂය ගණන හතරක් වන අතර, විභාගයෙන් සාමාර්ථය ලැබීම සඳහා සෑම විභාග අපේක්ෂකයකු ම එම විෂයයන් හතරෙන් ම සමත් විය යුතු ය. කෙසේ වෙතත් එක් වතාවක දී අදාළ විෂයය හතරෙන් එක් විෂයයක් පමණක් අසමත් නම් එය ඌන සාමාර්ථයක් ලෙස සලකනු ලැබේ. විභාගයට පෙනී සිටි වර්ෂයේ සිට අනුගාමී වසර දෙකක් (02) ඇතුළත දී එම ඌන සාමාර්ථය ලැබූ විෂයය සඳහා නැවත පෙනී සිට එය සමත් වී ඌන සාමාර්ථය සම්පූර්ණ කළ යුතු ය. (මෙය 2007 වසරේ විභාගයේ සිට බලපැවැත්වේ). ඌන සාමාර්ථය ලබන සිසුන් ඌන සාමාර්ථය සම්පූර්ණ කිරීමේ දී විභාගයට ඉල්ලුම් කළ යුත්තේ අනිවාර්යයෙන් ම ඌන සාමාර්ථය ලැබූ විෂයයට පමණි.

9.1 පෙනී සිටින සෑම විෂයයකම එක් එක් ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු සියයක් (100) හිමිවන අතර ලබා ගන්නා එක් එක් ශ්‍රේණි සඳහා අදාළ ලකුණු පරාසයන් පහත සඳහන් පරිදි වේ.

| *ලකුණු පරාසය* | *ශ්‍රේණිය* | *සංකේතය* |
|---|---|---|
| 0 - 34 | අසමත් | F |
| 35 - 54 | සමත් | S |
| 55 - 69 | සම්මාන | C |
| 70 - 100 | විශිෂ්ට සම්මාන | D |

9.2 අයැදුම්කරුවන්ගේ ප්‍රතිඵල ලැයිස්තු අදාළ දහම් පාසැල් ප්‍රධානීන් වෙත තැපැල් මගින් එවනු ලැබේ.

10. *සහතික පත්‍ර.*—මෙම විභාගයෙන් සමත් වන සෑම අයදුම්කරුවකුට ම සහතික පත්‍රයක් නිකුත් කිරීමට විධිවිධාන යොදනු ලැබේ. අදාළ සහතික පත්‍ර ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් දහම් පාසැල් ප්‍රධානාචාර්යවරුන් වෙත තැපැල් මගින් ලබාදෙනු ඇත. උක්ත විභාගය සමත්ව එහෙත් සහතික පත්‍රයක් නොලැබුණු යම් අපේක්ෂකයෙක් වේ නම්, ඒ පිළිබඳව දහම් පාසැල් ප්‍රධානාචාර්ය මගින්ම විභාග කොමසාරිස් ජනරාල්, ප්‍රතිඵල ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ. පෙ. 1503, කොළඹ යන ලිපිනයට ලිපියක් මගින් විමසීම් කළ යුතු ය.

11. *උත්තර පත්‍ර නැවත සමීක්ෂණය.*—දහම් පාසැල් ප්‍රධානාචාර්යවරුන්ගේ ඉල්ලීම් මත පමණක් උත්තර පත්‍ර නැවත සමීක්ෂණයට ඉඩදෙනු ලැබේ. විභාගයේ ප්‍රතිඵල නිකුත් වී දින 30ක් ඇතුළත මෙම දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරනු ලබන ආකෘති පත්‍රයකින් උත්තර පත්‍ර නැවත සමීක්ෂණය සඳහා ඉල්ලුම් කළ යුතු ය. මේ සඳහා වන ගාස්තු ප්‍රමාණයන් වරින් වර සංශෝධනය වීමට ඉඩ ඇති බැවින්, එය අදාළ අයදුම්පතෙහි දක්වනු ලැබේ. මෙම ගාස්තු ආපසු ගෙවනු ලබන්නේ මුලින්ම දෙන ලද ප්‍රතිඵලයක වෙනසක් කිරීමට සිදුවුවහොත් පමණකි. කවර හේතුවක් නිසාවත් අයදුම්කරුවන්ට හෝ ඔහුගේ නියෝජිතයින්ට හෝ උත්තර පත්‍ර පරීක්ෂා කර බැලීමට ඉඩ දෙනු නොලැබේ.

12. මෙම ව්‍යවස්ථා සහ විෂය නිර්දේශ සංග්‍රහයේ දක්වා ඇති විධිවිධානවලට අනුකූලව ක්‍රියා කිරීමට සියලුම විභාග අයදුම්කරුවන් බැඳී සිටින අතර, මෙහි විධිවිධාන සලසා නැති කවර හෝ යම් කරුණක් වෙතොත් එය විභාග කොමසාරිස් ජනරාල්ගේ අභිමතය පරිදි තීරණය වනු ඇත.

ඩබ්ලිව්. එම්. එන්. ජේ. පුෂ්පකුමාර,
විභාග කොමසාරිස් ජනරාල්.

2015 සැප්තැම්බර් මස 29 වැනි දින,
පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

### *විභාග විෂයය හා විෂයය නිර්දේශය*
### *(1993 සිට ඉදිරියට පැවැත්වෙන විභාග සඳහා)*

මෙම විභාගය පැය 03 බැගින් වූ ප්‍රශ්න පත්‍ර 4 කින් සමන්විතය.

### *I වැනි ප්‍රශ්න පත්‍රය*

#### බුද්ධ චරිතය

මෙම ප්‍රශ්න පත්‍රය කොටස් තුනකින් යුක්ත ය.

#### *I වැනි කොටස*

බුදුරජාණන් වහන්සේ ලොව පහළ වූ සමයෙහි පැවති භාරතීය සමාජය අවබෝධකර ගැනීම. :—

(අ) සාමාජික පසුබිම
(ආ) දේශපාලනික පසුබිම
(ඇ) ආර්ථික පසුබිම
(ඈ) ආගමික හා දාර්ශනික පසුබිම

#### *II වැනි කොටස - බුද්ධ චරිතය*

(අ) සිද්ධාර්ථ කුමාරෝත්පත්තියේ සිට සම්බුද්ධ පරිනිර්වාණය තෙක් බුද්ධ චරිතය.
(ආ) බුද්ධ චරිතයේ කැපී පෙනෙන විශිෂ්ට ලක්ෂණ - තාදී ගුණය, අසරණයන්ට පිහිටවීම, ගිලනුන්ට උපස්ථාන කිරීම, හික්මවිය යුතු පුද්ගලයන් හික්මවීම, ඉවසීම, අන්‍යමත ඉවසීම
(ඇ) බුදුරජාණන් වහන්සේගේ ලොව්තුරු ගුණ
(ඈ) බුදුරජාණන් වහන්සේගේ සමාජ ශෝධකත්වය
(ඉ) බුදුරජාණන් වහන්සේගේ නායකත්වය

#### *III වැනි කොටස - බුදුරජාණන් වහන්සේගේ සිව්වණක් පිරිස*

(අ) *භික්ෂු* - පස්වග භික්ෂූන්, සැරියුත් මුගලන්, මහා කාශ්‍යප, ආනන්ද, සීවලී, මහා කච්චාන, පුණ්ණමන්තානි පුත්ත, කුමාර කාශ්‍යප යන රහතන් වහන්සේ පිළිබඳ දැනුම.

(ආ) *භික්ෂුණී* - මහාප්‍රජාපතී ගෝතමී, ඛේමා, උප්පලවණ්ණා, භද්දකච්චානා, ධම්මදින්නා, අම්බපාලි, පටාචාරා යන තෙරණින් වහන්සේ පිළිබඳ දැනුම.
(ඇ) *උපාසක* - සේනිය, බිම්බිසාර, පසේ නදි කෝසල, අජාසත්, අනාථ පිණ්ඩික, ධම්මික යන උපාසකවරුන් පිළිබඳ දැනුම.
(ඈ) *උපාසිකා* - විශාඛා, කෝසල මල්ලිකා, සාමාවතී, ඛුජ්ජුත්තරා යන උපාසිකාවන් පිළිබඳ දැනුම.

*2 වැනි ප්‍රශ්න පත්‍රය*

**බුද්ධ ධර්මය හා පාලි භාෂා පරිචය**

මෙම ප්‍රශ්න පත්‍රය කොටස් තුනකින් සමන්විත ය.

*I වැනි කොටස - බුද්ධ ධර්මයේ මූලික ඉගැන්වීම*

(අ) පටිච්ච සමුප්පාදය
(ආ) චතුරාර්ය සත්‍යය
(ඇ) ත්‍රිලක්ෂණය
(ඈ) කර්මය සහ පුනර්භවය
(ඉ) නිර්වාණය

මෙම ධර්ම කරුණු පිළිබඳව ථෙරවාදී බෞද්ධ සම්ප්‍රදායයෙහි අර්ථ විවරණය පිළිබඳ සාමාන්‍ය අවබෝධය.

*II වැනි කොටස - භාවනා සහ අභිධර්මය*

(අ) සමථ, විපස්සනා භාවනා
(ආ) අභිධර්මයෙහි සතර පරමාර්ථ ධර්ම පිළිබඳ සාමාන්‍ය දැනුම

*III වැනි කොටස - පාලි භාෂා පරිචය*

පහත සඳහන් ගාථා සහ පාඨ සිංහලට පරිවර්තනය කිරීම :—

(අ) ධම්මපදය - යමක වග්ග 19, 20 ගාථා, පුප්ඵ වග්ග 03 වැනි ගාථාව, බාල වග්ග - 05, 06, 10, 14, 15 ගාථා පණ්ඩිත වග්ග, 12, 13, 14 ගාථා.

(ආ) චතු භාණවාර පාලි -
(i) මිත්තානිසංස සුත්ත
(ii) මෙත්තානිසංස සුත්ත
(iii) ඛන්ධ පරිත්ත

(ඇ) රසවාහිණී - දුට්ඨ ගාමිණී අභය මහාරඤ්ඤෝවත්ථු

(ඈ) *වන්දනා ගාථා සහ පාඨ*—
(i) තෙරුවන් ගුණ පාඨ සහ වන්දනා ගාථා
(ii) ආමිස පූජා ගාථා

*3 වැනි ප්‍රශ්න පත්‍රය*

**ශාසන ඉතිහාසය**

මෙම ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකින් යුක්ත ය.

(i) භාරතීය ශාසන ඉතිහාසය
(ii) ශ්‍රී ලංකා ශාසන ඉතිහාසය

*I වැනි කොටස - භාරතීය ශාසන ඉතිහාසය*

(අ) බෞද්ධ ධර්මදූත සේවාවේ ආරම්භය සහ බුද්ධ කාලීන ශාසන ව්‍යාප්තිය
(ආ) ධර්ම සංගායනා සතර
(ඇ) අශෝක සමය
(ඈ) අශෝක රජතුමා බෞද්ධයකු වීම
(ඉ) අශෝක ධර්මය
(ඊ) අශෝක රජුගේ ලෝක ශාසනික සේවාව
(උ) බෞද්ධ ඉතිහාසයේ අශෝක රජතුමාට හිමි තැන අගය කිරීම

*II වැනි කොටස - ශ්‍රී ලංකා ශාසන ඉතිහාසය*

(අ) මහින්දාගමනය සහ බුද්ධ ශාසන ප්‍රතිෂ්ඨාපනය
(ආ) භික්ෂුණී සමාජය
(ඇ) ශ්‍රී මහා බෝධීන් වහන්සේ වැඩම කරවීම
(ඈ) දන්ත ධාතූන් වහන්සේ වැඩම කරවීම
(ඉ) මහා විහාරය
(ඊ) අභයගිරි විහාරය
(උ) ජේතවන විහාරය
(ඌ) ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කිරීම
(එ) බුදු සමයෙන් ලක්වැසියන් ලද ආභාෂය

*4 වැනි ප්‍රශ්න පත්‍රය*

**බෞද්ධ සංස්කෘතිය**

මෙම ප්‍රශ්න පත්‍රය බෞද්ධ සිරිත් විරිත්, ශ්‍රී ලංකාවේ කලා ශිල්ප හා ලෝක බෞද්ධ සංස්කෘතිය යන කොටස් තුනකින් යුක්ත වෙයි.

*I වැනි කොටස - බෞද්ධ සිරිත් විරිත්*

(අ) බෞද්ධ සිරිත් විරිත්වල වැදගත්කම
(ආ) බෞද්ධ ආරාම (පැවිදි) ජීවිතය ආශ්‍රිත සිරිත් විරිත්
(ඇ) ආරාම ජීවිතය පදනම් වූ බෞද්ධ ගිහි සිරිත් විරිත්
(ඈ) ගිහි පවුල් ජීවිතය සම්බන්ධ සිරිත් විරිත්
(ඉ) ශාසනික කටයුතු පිළිබඳ සිරිත් විරිත්

(සාංඝික දාන, කඨින දාන, ධර්ම දේශනා හා ධර්ම ශ්‍රවණ, පිරිත් පින්කම් හා බෝධි පූජා) බෞද්ධ උත්සව.

*II වැනි කොටස - ශ්‍රී ලංකාවේ බෞද්ධ කලා ශිල්ප*

බුදු දහමෙන් සිදු වූ කලා පෝෂණය.
බෞද්ධ ගෘහ නිර්මාණ ශිල්පය. (ස්තූප, චෛතියඝර, බෝධිඝර, පඨමාඝර)

බෞද්ධ මූර්ති, කැටයම් හා චිත්‍ර කලාව—

(i) *බුදු පිළිමය.*—උපත හා ව්‍යාප්තිය, අනුරාධපුර සමාධි පිළිම, තොලුවිල සමාධි පිළිමය, අවුකන බුදු පිළිමය, ගල් විහාරේ බුදු පිළිම.

(ii) *කැටයම්.*—වාහල්කඩ, සඳකඩ පහණ, මුරගල්, කොරවක්ගල් හා පියගැට.

(iii) *බෞද්ධ චිත්‍ර කලාව.*—අනුරාධපුර, පොළොන්නරුව හා මහනුවර යුගයේ බිතුසිතුවම්. (මහියංගන ධාතු ගර්භය, තිවංක පිළිමගේ, දෙගල්දොරුව, කැලණියේ අළුත් විහාරය, ගෝතමී විහාරය යන ස්ථානවල බිතු සිතුවම්)

*III වැනි කොටස - සිංහල බෞද්ධ සාහිත්‍යය*

බෞද්ධ කථා සාහිත්‍යයේ ආචාර, විද්‍යාත්මක වටිනාකම, ජාතක පොත, සද්ධර්මරත්නාවලිය හා පූජාවලිය පිළිබඳ සාමාන්‍ය දැනීම.

සිංහල භක්ති කාව්‍යය.—බුදුගුණ අලංකාරය හා තුන් සරණය පිළිබඳ සාමාන්‍ය දැනුම

*IV වැනි කොටස - ලෝක බෞද්ධ සංස්කෘතිය*

පහත සඳහන් රටවලට බුදු දහම පැමිණීම, ව්‍යාප්තිය හා බෞද්ධ සංස්කෘතික ලක්ෂණ පිළිබඳ සාමාන්‍ය දැනුම—

(අ) මියන්මාර් (බුරුමය)
(ආ) තායිලන්තය
(ඇ) චීනය
(ඈ) ජපානය

*පරිශීලනය කළ යුතු ග්‍රන්ථ :*

බෞද්ධ සංස්කෘතිය - සිරිසීවලී හිමි
කලා ශිල්ප හා සාහිත්‍ය - ඩී. ආර්. ජයවර්ධන මයා

අතිරේක කියවීම් පොත් :
බුදු සිරිත - ආචාර්ය කේ. ඩී. පී. වික්‍රමසිංහ මයා

*1 වැනි උපලේඛනය*

දිස්ත්‍රික්ක හා දිස්ත්‍රික්ක අංකත්, විභාග මධ්‍යස්ථාන පිහිටුවන නගර හා නගර අංකත් පහත දැක්වේ :-

*දිස්ත්‍රික්කය — කොළඹ 01*

| නගරය | *නගර අංකය* |
|---|---|
| කොටහේන | 101 |
| මරදාන | 102 |
| බොරැල්ල | 103 |
| බම්බලපිටිය | 104 |
| මහරගම | 105 |
| ගල්කිස්ස | 106 |
| දෙහිවල | 107 |
| නුගේගොඩ | 108 |
| මොරටුව | 109 |
| පිළියන්දල | 110 |
| හෝමාගම | 111 |
| අවිස්සාවේල්ල | 112 |

*දිස්ත්‍රික්කය — ගම්පහ 02*

| නගරය | *නගර අංකය* |
|---|---|
| ගම්පහ | 201 |
| වේයන්ගොඩ | 202 |
| මිනුවන්ගොඩ | 203 |
| මීරිගම | 204 |
| මීගමුව | 205 |
| වත්තල | 206 |
| කැළණිය | 207 |

*දිස්ත්‍රික්කය — කළුතර 03*

| *නගරය* | *නගර අංකය* |
|---|---|
| කළුතර | 301 |
| පානදුර | 302 |
| අළුත්ගම | 303 |
| හොරණ | 304 |
| මතුගම | 305 |
| මීගහතැන්න | 306 |

*දිස්ත්‍රික්කය — මාතලේ 04*

| *නගරය* | *නගර අංකය* |
|---|---|
| මාතලේ | 401 |
| ගලේවෙල | 402 |
| දඹුල්ල | 403 |
| නාඋල | 404 |
| ලග්ගල - පල්ලේගම | 405 |

*දිස්ත්‍රික්කය — මහනුවර 05*

| *නගරය* | *නගර අංකය* |
|---|---|
| මහනුවර | 501 |
| කටුගස්තොට | 502 |
| නුගවෙල | 503 |
| තෙල්දෙනිය | 504 |
| මැද මහනුවර | 505 |
| වත්තේගම | 506 |
| ගලහ | 507 |
| ගලගෙදර | 508 |
| ගම්පොළ | 509 |
| නාවලපිටිය | 510 |
| පිළිමතලාව | 511 |

*දිස්ත්‍රික්කය — නුවරඑළිය 06*

| *නගරය* | *නගර අංකය* |
|---|---|
| නුවරඑළිය | 601 |
| හැඳුනුවැව | 602 |
| හැටන් | 603 |
| ගිනිගත්හේන | 604 |
| හඟුරන්කෙත | 605 |
| වලපනේ | 606 |

*දිස්ත්‍රික්කය — ගාල්ල 07*

| *නගරය* | *නගර අංකය* |
|---|---|
| ගාල්ල | 701 |
| අම්බලන්ගොඩ | 702 |
| බලපිටිය | 703 |

*ගාල්ල සම්බන්ධිතයි*

| *නගරය* | *නගර අංකය* |
|---|---|
| ඇල්පිටිය | 704 |
| බද්දේගම | 705 |
| උඩුගම | 706 |
| අහංගම | 707 |

*දිස්ත්‍රික්කය — මාතර 08*

| *නගරය* | *නගර අංකය* |
|---|---|
| මාතර | 801 |
| වැලිගම | 802 |
| කඹුරුපිටිය | 803 |
| හක්මන | 804 |
| දික්වැල්ල | 805 |
| අකුරැස්ස | 806 |
| දෙනියාය | 807 |
| කොටපොල | 808 |

*දිස්ත්‍රික්කය — හම්බන්තොට 09*

| *නගරය* | *නගර අංකය* |
|---|---|
| හම්බන්තොට | 901 |
| වලස්මුල්ල | 902 |
| වීරකැටිය | 903 |
| තංගල්ල | 904 |
| අම්බලන්තොට | 905 |
| බෙලිඅත්ත | 906 |
| තිස්සමහාරාමය | 907 |
| අගුණකොළපැලැස්ස | 908 |

*දිස්ත්‍රික්කය — වවුනියාව 10*

| *නගරය* | *නගර අංකය* |
|---|---|
| වවුනියාව | 1001 |

*දිස්ත්‍රික්කය — ත්‍රිකුණාමලය 11*

| *නගරය* | *නගර අංකය* |
|---|---|
| ත්‍රිකුණාමලය | 1101 |
| කන්තලේ | 1102 |

*දිස්ත්‍රික්කය — අම්පාර 12*

| *නගරය* | *නගර අංකය* |
|---|---|
| අම්පාර | 1201 |
| සේරංකඩ | 1202 |
| මහඔය | 1203 |
| දෙහිඅත්තකණ්ඩිය | 1204 |

*දිස්ත්‍රික්කය — පුත්තලම 13*

| *නගරය* | *නගර අංකය* |
|---|---|
| පුත්තලම | 1301 |
| ආණමඩුව | 1302 |
| හලාවත | 1303 |
| වෙන්නප්පුව | 1304 |

*දිස්ත්‍රික්කය — කුරුණෑගල 14*

| *නගරය* | *නගර අංකය* |
|---|---|
| කුරුණෑගල | 1401 |
| පොල්ගහවෙල | 1402 |
| ඉබ්බාගමුව | 1403 |
| මැල්සිරිපුර | 1404 |
| කුලියාපිටිය | 1405 |
| හෙට්ටිපොල | 1406 |
| නිකවැරටිය | 1407 |
| මහව | 1408 |
| ගල්ගමුව | 1409 |

*දිස්ත්‍රික්කය — අනුරාධපුර 15*

| *නගරය* | *නගර අංකය* |
|---|---|
| අනුරාධපුරය | 1501 |
| මැදවච්චිය | 1502 |
| කැකිරාව | 1503 |
| පදවිය | 1504 |
| ගලෙන්බිඳුනුවැව | 1505 |
| තඹුත්තේගම | 1506 |
| හොරොව්පතාන | 1507 |
| නොච්චියාගම | 1508 |

*දිස්ත්‍රික්කය — පොළොන්නරුව 16*

| *නගරය* | *නගර අංකය* |
|---|---|
| පොළොන්නරුව | 1601 |
| මනම්පිටිය | 1602 |
| හිඟුරක්ගොඩ | 1603 |
| මැදිරිගිරිය | 1604 |

*දිස්ත්‍රික්කය — බදුල්ල 17*

| *නගරය* | *නගර අංකය* |
|---|---|
| බදුල්ල | 1701 |
| වැලිමඩ | 1702 |
| බණ්ඩාරවෙල | 1703 |
| පස්සර | 1704 |
| මහියංගනය | 1705 |
| ගිරාඳුරුකෝට්ටේ | 1706 |
| මීගහකිවුල | 1707 |

*දිස්ත්‍රික්කය — මොණරාගල 18*

| *නගරය* | *නගර අංකය* |
|---|---|
| මොණරාගල | 1801 |
| බිබිල | 1802 |
| වැල්ලවාය | 1803 |
| කතරගම | 1804 |
| දොඹගහවෙල | 1805 |

*දිස්ත්‍රික්කය — කෑගල්ල 19*

| *නගරය* | *නගර අංකය* |
|---|---|
| කෑගල්ල | 1901 |
| අරණායක | 1902 |

*කෑගල්ල සම්බන්ධිතයි*

| *නගරය* | *නගර අංකය* |
|---|---|
| රඹුක්කන | 1903 |
| මාවනැල්ල | 1904 |
| රුවන්වැල්ල | 1905 |
| යටියන්තොට | 1906 |
| වරකාපොළ | 1907 |

*දිස්ත්‍රික්කය — රත්නපුර 20*

| | |
|---|---|
| රත්නපුර | 2001 |
| ඇහැලියගොඩ | 2002 |
| පැල්මඩුල්ල | 2003 |
| බලංගොඩ | 2004 |
| ඇඹිලිපිටිය | 2005 |
| රක්වාන | 2006 |
| කලවාන | 2007 |

10-557

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.